**ශීර්ෂය- 228අධිකරණ පරිපාලනය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 228 - අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 31 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූලි 06 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී

සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කරතිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) දේපල පිරියත හා උපකරණ**

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේ දී පහත සඳහන් අඩුපාඩුව අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තු පොත් අනුව ගොඩනැගිලි හා ඉදිකිරීම් වටිනාකම රු.1,115,633,828 ක් වූ අතර භාණ්ඩාගාර මුද්‍රිත (SA-82) ප්‍රකාශයට අනුව එම වටිනාකම රු.1,123,749,063 ක් වූයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දේපල පිරියත හා උපකරණ වටිනාකම රු.8,115,235 කින් වැඩියෙන් දක්වා තිබුණි. | මාවනැල්ල අධිකරණයේ නඩු භාණ්ඩ කාමරය ගොඩනැගීම වෙනුවෙන් කෙරීගෙන යන වැඩ යටතේ මෙම මුදල ගෙවීම් කිරීමේදී ගිණුම්ගත කර තිබුණි.මාවනැල්ල අධිකරණය පිහිටි ගොඩනැගිල්ල තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර වත්කම් ලෙස ගිණුම්ගත කිරීම සඳහා එවා තිබූ අතර, එම සම්පූර්ණ අගය ගිණුම්ගත කිරීමට කටයුතු කරන ලද බවත් තක්සේරු වටිනාකම තුළ උක්ත වටිනාකම ද ඇතුළත්ව ඇති බැවින් කෑගල්ල මහාධිකරණයේ කෙරීගෙන යන වැඩ ලෙස පැවති රු.8,115,235 ක වටිනාකම කෑගල්ල මහාධිකරණයේ වත්කම්වලින් ඉවත් කිරීමට කටයුතු කර ඇති බව දන්වා තිබුණි. | ස්ථාවර වත්කම් සිගාස් වැඩසටහන සමඟ සසඳා නිවැරදිව ගිණුම්වල වාර්තා කළ යුතු ය. |

**(ආ) අත්තිකාරම් ගිණුම් ශේෂ**

අත්තිකාරම් ගිණුම්වල වර්ෂය අවසානයට වූ ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට මහාධිකරණ කලාප විසින් ඉදිරිපත් කරන ලද රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් 'බී' ගිණුමට අනුව මහාධිකරණ කලාප 08 ක කේවල ණයශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව රු.638,410,286 ක් වූ අතර පාලන ගිණුමේ ශේෂය රු.639,175,873 ක් වූයෙන් ශේෂ අතර රු. 765,587 ක වෙනසක් | දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂය සහ අධිකරණ කලාප 26 විසින් ඉදිරිපත්කර තිබූ ගිණුම් අනුව පාලන ගිණුමේ ශේෂයත් අතර වෙනසට හේතු වී ඇත්තේ වර්ෂ ගණනාවක සිට පැවත එන ආරම්භක ශේෂයේ වෙනස බව දන්වා තිබුණි. | වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතු ය. |

පැවතුණ ද එම වෙනස හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2022 දෙසැම්බර් 31 දිනට බැඳීම් හා බැරකම් වටිනාකම රු.2,280,562 ක් වුව ද, එම වටිනාකම ඉක්මවා රු.27,209,028 ක් බැරකම් වශයෙන් ගෙවා තිබුණි. | 228 වැය ශීර්ෂය යටතේ අදාළ ව්‍යාපෘති සඳහා ලබා දී තිබූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බැවින්, අයවැය දෙපාර්තමේන්තුවේ උපදෙස් මත මූ.රෙ. 208 හි බලතල ප්‍රකාරව 110 අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ 110-1-02-25-2509 යන වැය විෂයය සඳහා අයවැය යෝජනා මඟින් ලබා දී තිබූ ප්‍රතිපාදන 228 වැය ශීර්ෂයේ ව්‍යාපෘති සඳහා ගෙවීම් කිරීමට ලබාගන්නා ලද බවත් දන්වා තිබුණි. | බැරකම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට වගබලා ගත යුතු වේ. |

### 2.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වරින්වර සමාලෝචනය සිදුකරන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සහතිකවීමක් කර ඇති අතර එය මූල්‍ය ප්‍රකාශ තුළ අන්තර්ගතකොට ඇති බව දන්වා තිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය වටිනාකම රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | | |
| | xxiv පරිච්ඡේදයේ 4.2.4 වගන්තිය | 7,404,657 | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව විශ්‍රාම ගැනීමට නියමිත නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය පිළිබඳ විස්තර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක ජනරාල් වෙත දන්වා යැවීමට කටයුතුකර නොතිබුණි. | විශ්‍රාම ගිය නිලධාරීන්ගේ ණයශේෂ සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපාදන නිදහස් කළ වහාම අයකරගැනීමට පියවරගන්නා ලෙස අදාළ අධිකරණවල නිලධාරීන් දැනුවත්කර ඇති බව දන්වා තිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| | xxiv පරිච්ඡේදයේ 4.2.4 වගන්තිය | | ආයතන සංග්‍රහයේ විධිවිධාන ඉක්මවා මහාධිකරණ කලාපයේ රෙජිස්ට්‍රාර්වරයෙකුට මෝටර් රථ ණය හා බයිසිකල් ණය ලබා දී තිබුණි. | නිලධාරියාගෙන් අයවිය යුතු හිඟ ණයශේෂයන් පිළිබඳව ලිපිගොනු පරික්ෂා කළද, මේ වන තෙක් කිසිදු තොරතුරක් සොයාගත නොහැකි බව ද, තවදුරටත් සොයා බලා එම ණයශේෂය අයකර ගැනීමට කටයුතු කරන මෙන් කොළඹ මහාධිකරණයට උපදෙස් ලබාදුන් බවද දන්වා තිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ii) | **ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| | මුදල් රෙගුලාසි 109 (1) හා (2) | 423,608 | වර්ෂ 10 ඉක්ම වූ අලාභහානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම අලාභ හානි වර්ෂ ගණනාවක් පැරණි අලාභ හානි බැවින් ඒවාට අදාළව පරීක්ෂණ පැවැත්වීම සම්බන්ධව පවතින ප්‍රායෝගික ගැටලු විසඳා ගැනීමට කටයුතු කර, ඒ අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| මුදල් රෙගුලාසි 104 | | සමාලෝචිත වර්ෂය තුළදී අනතුරටපත් වාහනයක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු අවසන්කර නොතිබුණි. | KP 1140 දරන වාහනයේ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු සිදු කරමින් පවතින බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| මුදල් රෙගුලාසි 396 | 2,850,922 | මහාධිකරණ කලාප 22 කට අයත් මාස 06 ඉක්ම වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | චෙක්පත් සම්බන්ධව මු.රෙ. 396 ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසට නිරන්තරයෙන් අධිකරණ දැනුවත්කර ඇති බව ද, ඉදිරියේදී වෙන් වෙන්ව අධිකරණයන්හි තොරතුරු කැඳවා ඒ පිළිබඳ අවධානය යොමුකර මෙම අඩුපාඩුව මගහරවා ගැනීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2.4 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්ය නිමකර දින 10 ක් තුළ අතුරු අග්‍රිම පියවිය යුතු වුව ද, අවස්ථා 10 කදී ලබාගත් රු.276,000 ක් වූ අත්තිකාරම් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතුකර නොතිබුණි. | තත්කාර්යය අතුරු අග්‍රිම ලබාගැනීමේදී අදාළ කාර්ය නිමකර දින 10 ක් ඇතුළත අත්තිකාරම් පියවීමට කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කරන ලද බව දන්වා තිබුණි. | අතුරු අග්‍රිම නියමිත කාලය තුළ නැවත පියවීමට කටයුතු කළ යුතු ය. |

## 2.5 තැන්පත් ශේෂයන්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රධාන කාර්යාලයේ වසර 03 කට වැඩි කොන්ත්‍රාත් සඳහා වූ රැඳවුම් මුදල් තැන්පතු ශේෂය රු.155,334,743 ක් විය. | නිදහස් කිරීමට හැකියාව පවතින සියලු රැඳවුම් මුදල් නිදහස් කිරීමටත් එසේ නොවන්නේ නම් මු.රෙ 571 ප්‍රකාරව රජයේ ආදායමට බැර කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව දන්වා තිබුණි. | වර්ෂ දෙක ඉක්ම වූ තැන්පතු නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කොළඹ මහාධිකරණය තුළ තෙවන පාර්ශවයන් වෙත ගෙවිය යුතු තාවකාලික රැඳවුම් තැන්පතු ගිණුම් වසර 05 කට වඩා පැරණි ශේෂය රු.26,248,905 ක් වූ අතර කොන්ත්‍රාත් සඳහා වූ රැඳවුම් මුදල් තැන්පතු ගිණුම තුළ වර්ෂ 05 කට වඩා පැරණි ශේෂය රු. 3,179 ක් විය. | නිරවුල් කිරීමට හැකියාව පවතින සියලු තැන්පත් ශේෂයන් කඩිනමින් නිදහස් කිරීමට කටයුතු කරන ලෙසත්, අදාළ තැන්පතු හිමිකරුවන් ඉල්ලුම් නොකරන ලද ශේෂයන් සම්බන්ධව මු.රෙ.571 හි දැක්වෙන ක්‍රියාමාර්ග අනුගමනය කර රජයේ ආදායමට බැර කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව දන්වා තිබුණි. | වර්ෂ දෙක ඉක්ම වූ තැන්පතු නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ඇ) | කළුතර මහාධිකරණයේ ටෙන්ඩර් තැන්පතු ගිණුම තුළ වසර 05 කට වඩා පැරණි ශේෂය රු.5,706,726 ක් වූ අතර කොන්ත්‍රාත් සඳහා වූ රැඳවුම් මුදල් තැන්පතු ගිණුම තුළ වර්ෂ 05 කට වඩා පැරණි ශේෂය රු.41,038 ක් විය. | නිරවුල් කිරීමට හැකියාව පවතින සියලු තැන්පත් ශේෂයන් කඩිනමින් නිදහස් කිරීමට කටයුතු කරන ලෙසත්, අදාළ තැන්පතු හිමිකරුවන් ඉල්ලුම් නොකරන ලද ශේෂයන් සම්බන්ධව මු.රෙ.571 හි දැක්වෙන ක්‍රියාමාර්ග අනුගමනය කර රජයේ ආදායමට බැර කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව දන්වා තිබුණි. | වර්ෂ දෙක ඉක්ම වූ තැන්පතු නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකාව තුළ පවතින සියලුම අධිකරණ ස්වයංක්‍රියකරණ ව්‍යාපෘතියේ දැනුවත් කිරීමේ වැඩසටහන පැවැත්වීම සඳහා රජයේ ප්‍රසම්පාද මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කිරීමකින් තොරව අමාත්‍යාංශය විසින් සකස්කරන ලද පිරිවිතරවලට ගැලපෙන පරිදි ඉහළ පහසුකම් සහිත හෝටල් 05 කින් දුරකථනය මගින් මිල ගනන් සාකච්ඡාකොට හෝටලයක් තෝරාගෙන ගාස්තු වශයෙන් රු.5,327,770 ක් ගෙවා තිබුණි. | මෙම දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානීන්, අනුකමිටු සාමාජිකයන්, උපදේශක කමිටුවල සාමාජිකයන්, අදාළ පාර්ශවකරුවන්ගේ නියෝජිත ආයතනවල ආරාධිතයන් වැනි සම්භාවනීය පුද්ගලයන් සහභාගී වූ අතර, එම නිලධාරීන්ට ගැලපෙන පහසුකම් සහිතව හා එම නිලධාරීන්ට ගෞරවාන්විතව සංග්‍රහ කිරීමට සුදුසු පරිසරයක වැඩසටහන පැවැත්වීම අවශ්‍ය වූ බැවින් කොළඹ නගරයේ සමීප ස්ථානයක් වීම, 2021.12.29 දිනට ලබාගත හැකි වීම යන කරුණු සලකා බලා විධායක නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් විසින් විනිවිදභාවය රැකෙන පරිදි දුරකථන මගින් සාකච්ඡා කර ඒ බව සටහන් තබා අත්සන් කර 2021.12.29 දිනට වෙන්කරගත හැකිව තිබූ හිල්ටන් හෝටලය ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ප්‍රකාරව තෝරාගෙන ඇති බව දන්වා තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුගතව කටයුතු කළ යුතු වේ. |

## 3.2 රජයේ නිලධාරීන් ඇප තැබීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව අධිකරණ සේවයේ නියුතු ඇප තැබිය යුතු නිලධාරීන් නියමිත පරිදි ඇප තැබිය යුතු වුව ද, මහාධිකරණ කලාප 08 ක නිලධාරීන් 45 දෙනෙකුගෙන් රු.970,000 ක මුදලක් ඇප වශයෙන් ලබාගත යුතු වුව ද, ඇප ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | විගණනය විසින් පෙන්වා දී ඇති කරුණු අනුව අධිකරණයන්හි ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප තැබීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලෙස සියලු අධිකරණ දැනුවත් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | පුත්තලම පළාත්බද මහාධිකරණයේ සේවයේ නියුතු නිලධාරීන් 12 දෙනෙකුගේ ඇප තැබිය යුතු මුදල් වෙනුවෙන් 2022 මැයි 18 වන දින ඇප බැඳුම්කර ලියාපදිංචිය සඳහා අධිකරණ අමාත්‍යාංශය වෙත ඒවා ඇති නමුත් සමාලෝචිත වර්ෂය තුළ දී ඒවා අනුමත කර නොතිබුණි. | විගණනය විසින් පෙන්වා දී ඇති කරුණු අනුව අධිකරණයන්හි ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප තැබීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලෙස සියලු අධිකරණ දැනුවත් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | ඇප බැඳුම්කර ලියාපදිංචිය කඩිනමින් අවසන් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ඇ) | නුවරඑළිය මහාධිකරණයේ නිලධාරීන් දෙදෙනෙකු වෙනුවෙන් පොදු 235 ආකෘතිපත්‍රය ඇප මුදල් තීරණය කිරීම පිළිබඳ නිර්දේශ 2022 මැයි 18 වන දින අධිකරණ අමාත්‍යාංශය වෙත යොමුකර ඇතත්, 2022 වර්ෂය තුළදී ඒ සඳහා අවශ්‍ය පියවරගෙන නොතිබුණි. | විගණනය විසින් පෙන්වා දී ඇති කරුණු අනුව අධිකරණයන්හි ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප තැබීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලෙස සියලු අධිකරණ දැනුවත් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් කඩිනමින් ඇප ලබාගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3.3 අනාර්ථික ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ළමුන්ගේ සාක්ෂි විවෘත අධිකරණයෙන් ලබා නොගෙන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධතා මගින් ලබාදීමේ ව්‍යාපෘතිය සඳහා ඇමතුම් කට්ටල 26 ක් ලබාගැනීමට රු.48,589,772 ක් හා පුවත්පත් දැන්වීම් වශයෙන් රු.118,827 ක වියදම් දරා තිබුණද, විගණිත දින වන විටත් අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි. | වීඩියෝ ඇමතුම් තාක්ෂණ කට්ටල 26 මිලදීගෙන මෙම අමාත්‍යාංශය යටතේ වූ අවශ්‍යතාවය සඳහා උපකරණ සවිකිරීම සිදුකරන ලද බවත්, ළමා ආරක්ෂක අධිකාරිය සමඟ සාක්ෂි ලබාගැනීමට සුදුසු ස්ථාන පිළිබඳව අවසන් නිගමනයකට පැමිණීමට නොහැකි වීමෙන් මෙය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වී ඇති බව දන්වා තිබුණි. | ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීම කෙරෙහි අවධානය යොමුකල යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය ස්වයංක්‍රියකරණ කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර පද්ධති අධ්‍යනයක් සිදු කිරීමේ වගකීම ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික නියෝජිත ආයතනයට පවරා තිබුණු අතර, ඒ වෙනුවෙන් උපදේශන සේවා සැපයීමට ගිවිසුම්ගත වී තිබූ රු.79,258,000 ක මුදලින් රු.36,466,500 ක් 2021 වර්ෂයේ දී ගෙවා තිබුණි. ව්‍යාපෘතිය වෙනුවෙන් 2017 වර්ෂයේ සිට 2022 අගෝස්තු 01 දක්වා රු.49,034,981 ක වියදම් දරා තිබුණත්, මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීම පමණක් සිදුකර තිබූ අතර, උපදේශක සේවා සැපයීම වෙනුවෙන් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජිත ආයතනයට ගෙවූ මුදලින් රු.26,746,499 ක මුදලක් නැවත අධිකරණ අමාත්‍යාංශය වෙත ප්‍රේෂණය කර තිබූ අතර, ව්‍යාපෘතිය අත්හිටුවීමට අමාත්‍යාංශය තීරණය කර තිබුණි. | මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද රජයේ වියදම් කප්පාදු කිරීමේ අංක 03/2022 හා 2022.04.26 දිනැති චක්‍රලේඛයේ උපදෙස් පරිදි මෙම ව්‍යාපෘතිය කල් දමා ඇති බවත් ව්‍යාපෘතියේ ඉතිරි මුදල් ලෙස ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය වෙතින් රු.26,746,499.00 ක මුදල අධිකරණ අමාත්‍යාංශය වෙත ලැබී මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණයකර ඇති බව දන්වා තිබුණි. | ලැබුණු මුදල් අදාළ කාර්යයට යෙදවිය යුතු අතර, එසේ නොවේ නම් වහාම මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළ යුතු ය. |

## 3.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකරණ ශාලා හා බන්ධනාගාර අතර වීඩියෝ සම්මන්ත්‍රණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා 2021 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව රු.100,498,168 ක වටිනාකමකට ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කොට තිබූ අතර, මේ සඳහා අධිකරණ අමාත්‍යාංශය බන්ධනාගාර දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය සමග ගිවිසුම්ගත වී තිබුණි.මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා බන්ධනාගාර හා අධිකරණ ශාලාවල තෝරාගත් ස්ථානවල තොරතුරු LGN ස්ථානගත කිරීම සඳහා අවශ්‍ය දෘඩාංග හා උපකරණ මිලදීගැනීම හා පලමු වසර නඩත්තුව සඳහා රු.61,996,408 ක මුදලක් 2021 දෙසම්බර් 21 දින ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය වෙත ගෙවා තිබුණි. වියදම් අධික මෙම ව්‍යාපෘතිය ටෙන්ඩර් කැඳවීමකින් තොරව ICTA ආයතනය වෙත පවරා තිබුණු අතර, 2023 පෙබරවාරි වන විට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම අත්හිටුවා තිබුණි.ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය වෙත ගෙවා තිබූ රු.61,996,408 ක මුදල 2023 පෙබරවාරි 28 දිනැතිව | රටේ වත්මන් ආර්ථික තත්ත්වය හේතුවෙන් අයවැය සලකා බැලීමේදී එකඟ වූ මුල් ව්‍යාපෘති පිරිවැය සැලකිය යුතු ලෙස වැඩි වූ බැවින් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය හා මෙම ව්‍යාපෘතිය පළමු වසර සඳහා (2021) ගෙවීම් කරන ලද ව්‍යාපෘති පිරිවැය ඇතුළත සීමිත කොටසක් ක්‍රියාත්මක කිරීමට 2022 වසරේදී සාකච්ඡා කළ අතර, 2021 වසරේදී ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය තවදුරටත් ක්‍රියාත්මක නොවන බව සලකා 2023 පෙබරවාරි මසදී ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය වෙත සිදුකළ රු.61,996,408 ක ගෙවීම අධිකරණ අමාත්‍යාංශය වෙත ලැබී මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර ඇති බව දන්වා තිබුණි. | ගිවිසුම්ගත කාලය තුළ වැඩ නිම කරවා ගැනීම කෙරෙහි අවධානය යොමු කල යුතුව තිබුණි. |

| | | | |
|---|---|---|---|
| | අමාත්‍යාංශය වෙත ආපසු එවා තිබූ අතර, වර්ෂයක කාලයක් තිස්සේ මෙම මුදල බාහිර ආයතනයක් විසින් ප්‍රයෝජනයට ගැනීමෙන් පසුව ආපසු එවීමට කටයුතු කර තිබුණි. | | |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයේදී මියගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණයශේෂය රු.4,748,929 ක් වූ අතර, ඒ තුළ වසර 05 කට වැඩි ණයශේෂය රු.337,872 ක් විය. | බොහෝ ණයශේෂ ලිපිගොනුවල පවතින අඩුපාඩු හේතුවෙන් මෙම ණය සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපාදන නිරවුල් කර නැති බවද, වර්ෂ ගණනාවක් සිට අය නොවී පවතින ණයශේෂ විධිමත් තොරතුරු නොමැති වීම හේතුවෙන් අයකර ගැනීමට අපහසු බවද, ණයශේෂ අයකරගැනීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් අධිකරණ වෙතින් මාසික ප්‍රගතිය ගෙන්වා ගැනීමට උපදෙස් ලබා දී ඇති බව දන්වා තිබුණි. | ණය ශේෂ කඩිනමින් අයකර ගත යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයේදී වැඩ තහනම් කර ඇති නිලධාරීන්ගෙන් අයවිය යුතු ණයශේෂය රු.10,225,759 ක් වූ අතර, ඒ තුළ ඇතුළත් වසර 05 කට වැඩි කාලයක සිට හිඟව පැවති ණයශේෂවල වටිනාකම රු.5,265,153 ක් විය. | බොහෝ ණයශේෂයන් ඉතා පැරණි වීම හා විධිමත් තොරතුරු නොමැති වීම හේතුවෙන් අයකර ගැනීමට අපහසු වී ඇති බවද, ඇතැම් වැඩ තහනම් නිලධාරීන්ගේ විනය කටයුතු අවසන් වී නොමැති බැවින් මෙම ණයශේෂ අයකර ගැනීමට අපහසු වී ඇති බවද දන්වා තිබුණි. | ණයශේෂ කඩිනමින් අයකරගත යුතු වේ. |
| (ඈ) | සේවය අතහැර ගොස් සිටි නිලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු ණයශේෂය රු.6,612,852 ක් වූ අතර, ඒ තුළ ඇතුළත් වසර 05 කට වැඩි කාලයක සිට අය නොවී පවතින ණය ශේෂවල වටිනාකම රු. 2,394,003 ක් විය. | රජයෙන් ලබාගන්නා ලද ණය මුදල් වහාම පියවීමට කටයුතු කරන මෙන් අදාළ මහාධිකරණ විසින් නිලධාරින් වෙත දන්වා යවා ඇත. සෑම උත්සාහයක්ම ගැනීමෙන් පසුව තවදුරටත් අයකර ගැනීමට නොහැකි ණය ශේෂ පමණක් කපාහැරීමට ඉදිරිපත් කරන ලෙසට සියලු මහාධිකරණ දැනුවත්කර ඇති බව දන්වා තිබුණි. | |
| (ඉ) | ව්‍යාපෘති 12 කට අදාළව 2017 හා 2019 වර්ෂවල දී කොන්ත්‍රාත්කරුවන්ට ලබා දී තිබූ කුලී වැඩ අත්තිකාරම්වලින් රු.239,387,159 ක ශේෂයක් 2022 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි. | අනුරාධපුර අධිකරණ සංකීර්ණය ඉදිකිරීමට අදාළ බිල්පත් කිසිවක් 2022 වර්ෂයෙහි ගෙවීමට ඉදිරිපත් කර නොතිබූ බැවින්, එම ව්‍යාපෘතියට අදාළව ලබාදුන් අත්තිකාරම් මුදල් පියවා ගැනීමට නොහැකි වී ඇති අතර, එම ව්‍යාපෘතියේ ඉදි කිරීම් කටයුතු වෙනුවෙන් ගෙවීමට ඉදිරිපත් කරනු ලබන ඉදිරි බිල්පත් මගින් | ගිවිසුම් ප්‍රකාරව කාර්යන් නිමකරවා ගැනීම කෙරෙහි අවධානය යොමුකල යුතුය. |

| | | |
|---|---|---|
| | තවදුරටත් අයවිය යුතු අත්තිකාරම් මුදල වන රු.6,503,988.60 ක මුදල පියවාගැනීමට කටයුතු කරනු ලබන බවත් වැලිමඩ, රත්නපුර හා පූගොඩ අධිකරණ සංකීර්ණ ඉදිකිරීමේ ව්‍යාපෘතිවලට අදාළව අයවිය යුතු අත්තිකාරම් මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලබන බවද, දන්වා තිබුණි. | |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයේ දී අනුමත කාර්ය මණ්ඩලය 4986 ක් වූ අතර, තථ්‍ය කාර්ය මණ්ඩලය 4252 ක් වූයෙන් නිලධාරීන් 734 ක පුරප්පාඩු පැවතුණි. | ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 යටතේ රාජ්‍ය වියදම් පාලනය කිරීම යටතේ රජයේ සේවයට බඳවා ගැනීම සීමා කිරීම හේතුවෙන් පුරප්පාඩු සම්පූර්ණ කිරීමට නොහැකි වී ඇති බව දන්වා තිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ආ) | කාර්යාල සේවක අධිකරණ ආරක්ෂක,සිතාසි බෙදන්නන් හා ඇසිකිසි ක්‍රියාත්මක කරන්නන් යන තනතුරුවල ඉහළ පුරප්පාඩු ප්‍රමාණයක් පැවතුණු අතර එම ප්‍රමාණයන් පිළිවෙලින් 516, 70 හා 136 ක් වශයෙන් විය. | ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 යටතේ රාජ්‍ය වියදම් පාලනය කිරීම යටතේ රජයේ සේවයට බඳවා ගැනීම සීමා කිරීම හේතුවෙන් පුරප්පාඩු සම්පූර්ණ කිරීමට නොහැකි වී ඇති බව දන්වා තිබුණි. | කාර්ය මණ්ඩලය නැවත සමාලෝචනය කර පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතු වේ. |
| (ඇ) | අම්පාර, අවිස්සාවේල්ල, හෝමාගම යන කලාප වෙනුවෙන් ගණකාධිකරණ තනතුරු සඳහා වැඩ බලන ගණකාධිකාරීවරුන් තිදෙනෙකු අනුයුක්ත කර තිබුණු අතර, එම කලාප සඳහා එම තනතුර පුරප්පාඩු වූ කාලය පිළිවෙලින් වර්ෂ 3,2,1 ක් වශයෙන් විය. | වැඩබැලීමේ පදනම මත සේවය කරනු ලබන නිලධාරීන් තිදෙනාගේ වැඩබැලීමේ කාලය තවදුරටත් දීර්ඝ කරදීමට හා රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගෙන ඇති ගණකාධිකාරී තනතුර දැරූ නිලධාරීන් දෙදෙනෙකු කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීමටත්, අධිකරණ බල සීමාව තුළ ආසන්නතම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ නිරත ගණකාධිකාරීවරුන් වැඩබැලීමේ පදනම මත සේවයේ යොදවන ලෙසත් නිර්දේශකර ඇති බව දන්වා තිබුණි. | පුරප්පාඩු ස්ථිර පදනමින් සම්පූර්ණ කරගැනීමට කටයුතු කළ යුතු වේ. |